# විශේෂ නිවේදනයයි.

**ඊශ්‍රායලයේ වාසය කරන සියළුම ශ්‍රී ලාංකිකයින් වෙත,**

ඊශ්‍රායලයේ කොරෝනා වෛරස් වසංගතය පැතිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර නිකුත් කරන ලද නිවේදනවලට වැඩිමනත් වශයෙනි.

ඊශ්‍රායල් බලධාරීන් ට අනුව, ඊශ්‍රායලයේ තහවුරු කරන ලද කොරෝනා රෝගීන් සංඛ්‍යාව 529 ක් දක්වා මේ වනවිට වැඩි වී ඇත.

ඊශ්‍රායල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශයන්ට අනුකූලව, ඊශ්‍රායල් පුරවැසියන් හෝ ඊශ්‍රායලයේ පදිංචිකරුවන් නොවන සියළුම විදේශීය ජාතිකයින්ට නිරෝධායන අවශ්‍යතාවය සම්පූර්ණ කිරිමට එකඟ වුවද 2020 මාර්තු 18 දිනෙන් පසුව ඊශ්‍රායලයට ඇතුළුවීමට අවසර ලබා නොදීමට ඊශ්‍රායල ජනගහන, ආගමන සහ දේශසීමා පාලන අධිකාරිය (PIBA)විසින් තීරණය කර ඇත.

මෙම නියෝගය වහාම ක්‍රියාත්මක වන අතර එය ඊශ්‍රායලයට ඇතුළුවීම සඳහා වන සියළු ජාත්‍යන්තර දේශ සීමා දොරටු (Border Crossings) සඳහා අදාළ වේ.

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ටෙල් අවිව්, ඊශ්‍රායලය**

19.03.2020